සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය	අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019	60	S	I

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය — **කාලය පැය තුනයි**

සැලකිය යුතුයි :- ● සියළු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
● අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
● දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

සංචාරක ව්‍යාපාර ආයතනයක <u>මුරකරුවෙකු</u> ලෙස සේවය කරන හසින්ත සති අන්තයේ <u>අසනීපයෙන් පෙළෙන</u> මව බැලීමට <u>ගුණදායී කෑම වර්ග</u> රැගෙන තම නිවසට පැමිණියහ.

1) මෙම සිද්ධියේ තද අකුරින් ඇති අවස්ථා අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
i) ප්‍රවාහනය, බෙහෙත්, ආහාර   ii) ආරක්ෂාව, සෞඛ්‍යය, ආහාර
iii) ප්‍රවාහනය, සෞඛ්‍ය, ආරක්ෂාව   iv) ආරක්ෂාව, ආහාර, බෙහෙත්

2) සංචාරක කර්මාන්තයට ඇති තර්ජනයක් නොවන්නේ,
i) සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර බහුල වීම.   iii) කලහකාරී පරිසරයක් රටතුල පැවතීම.
ii) සේවකයන්ගේ භාෂා දැනුම අල්ප වීම.   iv) දේශීය භාණ්ඩ මිල ගණන් ඉහල යාම.

3) ව්‍යාපාර ආයතනයකට රජය හා කලමනාකරුවන් ඇල්ම දැක්වීමට බලපාන කරුනු පිළිවෙලින් ඇතුලත් පිළිතුර වන්නේ,
i) රැකියා අවස්ථා උත්පාදනය , රැකියා වර්ධනය හා රැකියා තෘප්තිය
ii) රැකියා වර්ධනය හා රැකියා තෘප්තිය , තීරණ ගැනීම හා එම තීරණ ක්‍රියාත්මක කිරිම
iii) ජාතික නිෂ්පාදිතය වර්ධනය කිරීමට , රැකියා සුරක්ෂිත බව
iv) බදු ආදායම නිසිලෙස ලබා ගැනීම , ව්‍යාපාරයේ අනාගත වර්ධනය

4) ප්‍රදේශයේ නිවෙස් වලින් මිලට ගන්නා විවිධ පළතුරු ගෙඩිපිටින් හා පානවර්ග ලෙස සකස්කර අලෙවි කිරිමේ ව්‍යාපාරයක් පවත්වා ගෙනයන ගිම්හානිගේ ව්‍යාපාරයේ පළතුරු යන්න අයත්වන්නේ,
i) භූමිය   ii) ශ්‍රමය   iii) ප්‍රාග්ධනය   iv) ව්‍යවසායකත්වය

5) "මුතු" තමාගේ මල් පැල අලෙවි ව්‍යාපාරය ලියාපදිංචි කර පවත්වා ගෙන යාමට අදහස් කරයි. ඇය මෙම ව්‍යාපාරය ලියාපදිංචි කල යුත්තේ,
i) ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ   iii) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත යටතේ
ii) 2017 අංක 7 සමාගම් පනත යටතේ   iv) වංචා වැලැක්වීමේ ආඥා පනත යටතේ

6) පහත වාක්‍ය ඛන්ඩ අතුරින් ව්‍යාපාර සංවිධාන සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
i) සියලු ම ලාභ අයිතිකරු සතුවි ම ඒකපුද්ගල ව්‍යාපාර වල ලක්ෂණයකි.
ii) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව ආරම්භක ප්‍රාග්ධනය 1000/= වැඩිනම් ලිඛිත ගිවිසුමකින් පවත්වා ගෙන යා යුතුය.
iii) සාමාජික සුබසාධනය වෙනුවෙන් කටයුතු කිරීම සමුපකාර සමිතියක වාසියකි.
iv) ලාභය හා අයිතිය බෙදී යාම සමාගම් වල අවාසියකි.

7) ව්‍යාපාර පරිසරයේ සිදු වු සිදුවීම් කීපයක් පහත දැක්වේ.

A. නවීන තාක්ෂණය ලබාගත හැකිවීම   C. ජාත්‍යන්තර සබදතා ඇතිවිම
B. යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති   D. කාර්යක්ෂම යන්ත්‍රසුත්‍ර ලබා ගත හැකිවීම

ඉහත සිදු වීම් අතුරින් ගෝලීය පරිසරයේ හිතකර බලපෑම් පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

i) AB හා D   ii) A හා C   iii) AC හා D   iv) A හා D

8) පහත වගන්ති අතුරින් ජංගම ගිණුමක ලක්ෂණ පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,
i) චෙක්පත් මගින් ගණුදෙනු කලහැක , පොලියක් හිමිවේ.
ii) බැංකු ප්‍රකාශය ලැබේ , පාස් පොතක් හිමිවේ.
iii) අයිරා පහසුකම් ලබාගත හැක , බැංකු ගාස්තු අය කරයි.
iv) පොලි හිමිවේ , අයිරා පහසුකම් ලබා ගත හැක.

8) පහත වගන්ති අතුරින් ජංගම ගිණුමක ලක්ෂණ පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,
i) චෙක්පත් මගින් ගණුදෙනු කලහැක , පොලියක් හිමිවේ. ii) බැංකු ප්‍රකාශය ලැබේ , පාස් පොතක් හිමිවේ.
iii) අයිරා පහසුකම් ලබාගත හැක , බැංකු ගාස්තු අය කරයි. iv) පොලි හිමිවේ , අයිරා පහසුකම් ලබා ගත හැක.

9) බුද්ධිණී පවත්වා ගෙන යන රූපලාවන්‍ය ආයතනයට අවශ්‍ය මල්තොගයක් නුවරඑළියේ සිටින මිතුරෙකු වන නෙත්මිණගෙන් ලබා ගත් අතර එහි වටිනාකම රු: 25000/= තම මහජන බැංකුවේ චෙක් පතකින් පියවන ලදි. ඔහු එම චෙක්පත ඔහුගේ ලංකා බැංකු ජංගම ගිණුමේ තැන්පත් කරන ලදි.

ඉහත සිද්ධියේ සඳහන් චෙක් පතේ අණකරු, ආදායකයා, අණලද්දා පිළිවෙලින් ඇතුලත් පිළිතුර වන්නේ,

i) බුද්ධිණී, නෙත්මිණ, මහජන බැංකුව
iii) බුද්ධිණී, මහජන බැංකුව, නෙත්මිණ
ii) නෙත්මිණ, බුද්ධිණී, ලංකා බැංකුව
iv) නෙත්මිණ, ලංකා බැංකුව, බුද්ධිණී

10) පහත වාක්‍ය අතුරින් විද්‍යුත් මුදල් සම්බන්ධ ව දක්වා ඇති නිවැරදි වාක්‍යයන් ඇතුලත් පිළිතුර,

A. මුදල් හා චෙක්පත් වෙනුවට ආදේශ කලහැකි ගෙවීම් ක්‍රමයකි.
B. මහජන බැංකුව හා ලංකා බැංකුවේ ටෙලර් පත්‍රිකා "PET" හා "SET" ලෙස හඳුන්වයි.
C. දත්ත විනාශ වීමේ අවදානමක් පැවතිම විද්‍යුත් මුදලේ සීමාවකි.
D. ණයපත් ගණුදෙනු සඳහා බැංකු ගිණුමක් අවශ්‍ය වේ.

i) A , B ii) A , B , C iii) A , C iv) A, C , D

11) රක්ෂ හිමිකම සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
i) නිවසක් කුලියට ගත් අයෙකුට නිවස පිළිබඳ රක්ෂහිමිකමක් නොමැත.
ii) ගුරුවරයාට තම ශිෂ්‍යයා පිළිබඳ රක්ෂ හිමිකමක් නොමැත.
iii) මවකට තම පුතාගේ ජීවිතය පිළිබඳ රක්ෂ හිමිකමක් නොමැත.
iv) උකසට ගත් ස්වර්ණාභරණ පිළිබඳ රක්ෂ හිමිකමක් උකස්කරුට නොමැත.

12) මුහුදු ප්‍රවාහනයේ ප්‍රධාන තම වාසිය වන්නේ,
i) ඕනෑම ස්ථානයකට ප්‍රවාහනය කල හැකිවිම.
ii) විශාල එමෙන්ම බර වැඩි තොග අඩු පිරිවැයකින් ප්‍රවාහනය කල හැකිවිම.
iii) දුර ගමන් සඳහා වේගවත් වීම.
iv) පිරිවැය අඩුවිම හා වේගවත් විම.

13) අභ්‍යන්තර සන්නිවේදන ක්‍රම පමණක් ඇතුලත් වාක්‍ය ඛන්ඩය වන්නේ,
i) ශබ්ද වාහිනි යන්ත්‍ර , ප්‍රවෘත්ති පත්‍ර , රැස්වීම්
ii) රැස්වීම් , දැන්වීම් පුවරුව , වැඩමුළු
iii) චක්‍රලේක , ගුවන්විදුලි , ලිපි
iv) රැස්වීම් , බැනර් , අන්තර් ජාලය

14) ව්‍යාපාරයක ඉදි කිරිමේ හා අලෙවි කටයුතු සඳහා කළමනාකරුවන් පත්කිරිම............................. වන අතර සැලසුම් කල පරිදි එම නිවාස අලෙවි කර ඇත්දැයි සොයා බැලිම............................ වේ.

ඉහත හිස්තැන් සඳහා ගැලපෙන පද පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

i) සංවිධානකරණය , පාලනය
ii) මෙහෙයෙ වීම , පාලනය
iii) සැලසුම්කරණය , සංවිධානකරණය
iv) සැලසුම්කරණය , පාලනය

15) තම නිවසේ සිට විවිධ රසකැවිලි සාදන සෙව්මිණි <u>සුරක්ෂිත ඇසුරුම්</u> වල බහා නිවසට පැමිණෙන්නන් හට අලෙවි කරයි. විශාල <u>ඇනවුම් ණය පදනමට</u> ලබාදෙන අතර ඔවුන්ගේ <u>නිවෙස්වලට ප්‍රවාහනය</u> කර දීමට ද කටුයතු කරයි. නිවස ඉදිරිපස විවිධ රසකැවිලි අලෙවි කරන බව <u>බැනර් පත්‍රිකාවක</u> ප්‍රදර්ශනය වේ.

ඉහත සිද්ධියේ තදකළු අතුරින් මුද්‍රිත අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් ඇතුලත් පිළිතුර වන්නේ,

i) නිෂ්පාදිත , මිල , ස්ථානය , ප්‍රවර්ධනය
ii) බෙදා හැරීම , ප්‍රවර්ධනය , නිෂ්පාදිතය , මිල
iii) ප්‍රවර්ධනය , මිල , ස්ථානය , නිෂ්පාදිතය
iv) ගුණත්වය , මිල , ස්ථානය , ප්‍රවර්ධනය

16) සඳුනි තමා සතු රු: 200,000/= මුදල වඩාත් සුරක්ෂිත, ඉතාමත් ඉහළ පොළියක් ලැබෙන කෙටිකාලින ආයෝජන මාර්ගයක ආයෝජනය කිරිමට අදහස් කරයි. ඇය ඒ සඳහා තෝරාගත යුත්තේ,
i)කොටස් මිලදී ගැනීම
ii) දේපළ මිලදී ගැනීම
iii)භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම
iii) ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීම

17) ගිණුම්කරණය යන්න වඩාත් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

i) ගිණුම්කරණය තුලින් ව්‍යාපාරයේ සෑම තොරතුරක්ම සපයයි.
ii) සෑම ව්‍යාපාරයක් ම ගිණුම් තැබිම අනිවාර්යෙන් සිදුකල යුතුයි.
iii) ගිණුම්කරණය තුලින් සම්පත් පාලනයට බලපෑමක් ඇති නොවේ.
iv) ඇල්මැති පාර්ශව වලට අවශ්‍ය තොරතුරු සපයයි.

18) ව්‍යාපාරයක සිදු වු ගණුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට පහත පරිදි බලපා ඇත.

වත්කම්	=	හිමිකම්	+	වගකීම්
-25000	=	+75000	-	100,000

ඉහත සිදුවී ඇතැයි සිතිය හැකි ගණුදෙනුව වන්නේ

i) බැංකු ණය රු. 100,000/= ලබාගෙන රු. 25000/= පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.
ii) මුදලින් රු. 25000/= පෞද්ගලිකව 75000/= සමඟ ණයගෙවා දැමීම.
iii) රු. 100,000/= ණයක් ගෙන ප්‍රාග්ධනය ලෙස යෙදවීම.
iv) රු. 25000/= බඩු තොගයක් ණයටද රු. 75000/= බඩුතොගයක් පෞද්ගලික ප්‍රයෝජනයට ද ගැනීම

19) ණයගැති හසින්ත ගෙන් ලැබිය යුතු රු: 50000/= මුදල 5% වට්ටමකට යටත්ව මුදලින් ලැබීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

i) මුදල් ගිණුම (හර) 50000
   ණයගැති ගිණුම (බැර) 50000

ii) මුදල් (හර) 50000
   දුන්වට්ටම් (බැර) 2500
   ණයගැති (බැර) 47500

iii) මුදල් ගිණුම (හර) 47500
   දුන්වට්ටම් (හර) 2500
   ණයගැති ගිණුම 50000

iv) මුදල් (හර) 47500
   ලදවට්ටම් (හර) 2500
   ණයගැති (බැර) 50000

20) ව්‍යාපාරයක ලීබඩු ක්‍ෂය ගිණුම A වන අතර ගැනිලි ගිණුම B වේ.
ඉහත ප්‍රකාශයේ A හා B ස්ථාන වලට අදාළ ගිණුම් වන්නේ,

i) වත්කම් , වියදම් ii) වියදම් , ආදායම් iii) වියදම් , හිමිකම් iv) වත්කම් , හිමිකම්

21) වැඩිවීම "බැර" අඩුවීම "හර" යන ද්විත්ව සටහන් මුලධර්මය නිරූපනය වන ගිණුම වන්නේ,

i) විදුලි බිල් ගිණුම ii) විකුණුම් ගිණුම
iii) දුන් වට්ටම් ගිණුම iv) යන්ත්‍ර ක්ෂය ගිණුම

22) නිමි ඇඳුම් අලෙවි ව්‍යාපාරයක පහත ගණුදෙනු සිදු වී ඇත.

A. රු: 20000/= නිමි ඇඳුම් තොගයක් විදුෂාට ණයට විකිණීම
B. රු: 15000/= විදුෂාගෙන් මුදල් ලැබීම
C. රු: 5000/= බොල්ණය කපා හැරීම

ඉහත ගණුදෙනු වලට අදාළ මූලාශ්‍ර ලේඛන පිළිවෙලින් දැක්වෙන්නේ,

i) විකුණුම් ජ'නලය, මුදල්පොත, පොදු ජ'නලය ii) ඉන්වොයිසිය, වවුචර්, ලදුපත
iii) විකුණුම් ජ'නලය, මුදල්පොත, මුදල්පොත iv) ඉන්වොයිසිය, ලදුපත, ජ'නල් වවුචර්

23) 2019.08.31 දිනට බැංකු ගිණුමට අනුව ශේෂය රු. 44000/= කි. බැංකු ප්‍රකාශයේ ශේෂය මීට වෙනස් විය. වෙනසට පහත හේතු බලපා තිබුණි.

A. නිකුත් කල ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් රු. 5000/=
B. බැංකුව අයකල බැංකු ගාස්තු රු. 2000/=
C. ණයගැති ප්‍රේෂණ රු. 8000/=
D. නිකුත් කල බැංකුව විසින් අගරු කරන ලද චෙක්පත් රු. 9000/=

සංශෝධිත බැංකු ගිණුමට අනුව ශේෂය වන්නේ

i) රු. 42000/= ii) රු. 50000/=
iii) රු. 52000/= iv) රු. 59000/=

24) බැංකු ප්‍රකාශයට අනුව ශේෂය වන්නේ,

i) රු. 46000/= ii) රු. 48000/= iii) රු. 57000/= iv) රු. 64000/=

25) පහත දැක්වෙන්නේ ගිණුම් තැබීමේ වරදක් නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහනකි

ණයගැති ගිණුම (හර) 18000
   අවිනිශ්චිත ගිණුම (බැර) 18000

ගිණුම් තැබීමේදි සිදුවී ඇතැයි සිතිය හැකි වරද වන්නේ,

I) රු. 42000/= ණයට විකුනුම් ණයගැති ගිණුමේ 24000/= ලෙස සටහන් වීම.
ii) රු. 18000/= විකුනුම් ඉන්වොයිසියක් පොත්වලින් මගහැරීම.
iii) රු. 24000/= ණයට විකුනුම් රු. 42000/= ලෙස ණය ගැති ගිණුමේ සටහන් වී තිබීම.
iv) ණයගැතියන් ගෙන් 18000/= මුදල් ලැබීම ණයගැති ගිණුමේ සටහන් නොවීම.

26) ව්‍යාපාරයක් පිළියෙල කල ශේෂ පිරික්සුමේ හර එකතුව රු. 690000/= බැර එකතුව රු. 960000/= විය. අවිනිශ්චිත ගිණුමට මාරුකල යුතු අගය වන්නේ,

i) අවිනිශ්චිත ගිණුම (හර) 690,000
ii) අවිනිශ්චිත ගිණුම (බැර) 960,000
iii) අවිනිශ්චිත ගිණුම (හර) 270,000
iv) අවිනිශ්චිත ගිණුම (බැර) 270,000

27) රසාංගගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු: 5000/= කි. 2019.08.01 දිනට සුළු මුදල් භාරකරු සතුව රු. 600/= ක් තිබුණි. අගෝස්තු මස සිට අග්‍රිමය 6000/= දක්වා වැඩි කිරීමට ව්‍යාපාරය තීරණය කරන ලදි. අගෝස්තු 01 දිනට ප්‍රතිපූර්ණය කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

i) රු. 6000/=
ii) රු. 5400/=
iii) රු. 5000/=
iv) රු. 4400/=

28) පහත සිදු වී ඇති ගණුදෙනු අතරින් පොදු ජ'නලයේ සටහන් කරන ගණුදෙනු පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

A) - අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 5000/=
B) - ලිපිද්‍රව්‍ය රු. 5000/= මිලට ගැනීම විදුලිය ගිණුමේ සටහන්ව තිබීම
C) - රු. 500,000/= මෝටර් රථයක් ණයට ගැනීම
D) - ගොඩනැගිලි ක්ෂය රු. 10000/=

i) A , C
ii) A , B , C
iii) A, B, C, D
iv) A , C , D

29) තරු දිලෙන ක්‍රීඩා සමාජයේ 2018 වර්ෂයේ සාමාජික සංඛ්‍යාව 250 කි. සාමාජික මුදල එක් අයෙකුගෙන් මාසිකව රු. 100/= අය කෙරේ. 2018 ජනවාරි මස පළමු දිනට සාමාජිකයන් 10 දෙනෙකුගේ මුදල් ලැබිය යුතුව තිබුණි. 2018 වසරේ සාමාජිකයින් 30 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නොතිබුණ අතර ඉතිරි සියළු මුදල් ලැබී තිබුණි. 2018 වර්ෂයේ ලද සාමාජික මුදල වන්නේ,

i) රු: 23000/=
ii) රු: 26000/=
iii) රු: 276,000
iv) රු: 300,000

30) සමිති සංවිධානයක් පිළියෙල කරන ගිණුම් සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i) මුදල් කළමනාකරණය ක්‍රමවත් වීම ලැබීම් ගෙවීම් ගිණුමේ අරමුණකි
ii) ආදායම් ප්‍රකාශය පිළියෙල කරනුයේ මුදල් පදනමටය
iii) ලැබීම් හා ගෙවීම් ගිණුමේ කාලච්ඡේදයට අදාළ ආදායම් වියදම් සටහන් කරයි
iv) ආදායම් ප්‍රකාශයෙන් ශුද්ධ ලාභය හෝ අලාභය සොයා ගත හැක.

පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 31 හා 32 සඳහා පිළිතුරු සපයන්න.

භාග්‍යා හා නවෝද්‍යා පවත්වා ගෙන යන නිමි ඇඳුම් ව්‍යාපාරයේ 2018 වර්ෂයට අදාළ තොරතුරු පහත දැක්වේ.

සෘජු ද්‍රව්‍ය පිරිවැය රු: 800,000
විදුලිය හා අනෙකුත් පොදු කාර්ය වියදම් රු: 500,000
සෘජු වෙනත් පිරිවැය රු: 200,000

2018 වර්ෂය තුල නිමි ඇඳුම් 5000 ක් නිපදවා ඇති අතර සෑම නිමි ඇඳුමක් සඳහාම ඇඟලුම් සේවිකාවන්ට රු: 100/= ක් ගෙවයි. ඒකකයක පිරිවැයට 25% ලාභයක් තබාගෙන විකුණුම් මිල තීරණය කරයි.

31) නිමි ඇඳුමක නිෂ්පාදන පිරිවැය වන්නේ,

i) රු: 200/=
ii) රු: 300/=
iii) රු: 400/=
iv) රු: 500/=

32) ව්‍යාපාරයේ අපේක්ෂිත මුළු ලාභය වන්නේ,

i) රු: 250,000/=
ii) රු: 375,000/=
iii) රු: 500,000/=
iv) රු: 625,000/=

33) සචිනි නිම්සරාගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව පහත ගැළපීම් සිදුකල යුතුව ඇත.

* ව්‍යාපාරයේ මාසික ගොඩනැගිලි කුලිය 15000/= වන අතර වසර තුල ගෙවා ඇත්තේ රු: 135,000/= ක් පමණි.
* 2018.01.01 දින රු: 400,000/= බැංකු ණයක් ලබාගෙන ඇති අතර පොලි ප්‍රතිශතය 15% කි. වර්ෂය තුල ණය පොලි රු: 50000/= ගෙවා ඇත.

ඉහත තොරතුරු වලට අදාළ නිවැරදි වගන්තිය වන්නේ,

i) වර්ෂයට අදාළ ගොඩනැගිලි කුලිය රු: 135000/= වන අතර උපචිත ණයපොලිය රු: 10000/= කි
ii) උපචිත ගොඩනැගිලි කුලී රු: 45000/= වන අතර ලාභ ලාභ ප්‍රකාශයේ ණයපොලී 50000/= වියයුතුය.
iii) ලාභ ලාභ ප්‍රකාශයේ දැක්වන ගොඩනැගිලි කුලි 180,000/= වන අතර ණයපොලි රු: 10000/= ජංගම වගකීම් වේ.
iv) ලාභ ලාභ ප්‍රකාශයේ ගොඩනැගිලි කුලි රු: 135,000/= ද ණයපොලි රු: 50000/= ලෙස දැක්විය යුතුය.

34) ව්‍යාපාරයක් විසින් මිලදී ගත් යන්ත්‍රයකට අදාළ තොරතුරු පහත දැක්වේ. මෙම ව්‍යාපාරයේ ගිණුම් වර්ෂය 2018.12.31 දිනෙන් අවසන් වේ.

2018.07.01 මිලදී ගත් යන්ත්‍රයේ ගැණුම් මිල	800,000
සවිකිරීමේ පිරිවැය	200,000
සුන්බුන් අගය	40,000
ඵලදායී ජීව කාලය වසර 5	

2018.12.31 දිනෙන් අවසන් වර්ෂයේ යන්ත්‍ර ක්ෂය වන්නේ,

i) රු: 200,000/= ii) රු: 192,000/= iii) රු: 160,000/= iv) රු: 96000/=

පහත තෙරතුරු උපයෝගී කරගෙන අංක 35-40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

කසුනි මධුෂාණිගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට ගිණුම් පොත් වලින් උපුටාගත් ශේෂ කීපයක් පහත දැක්වේ.

මෝටර්රථය	600,000
2018.01.01 තොගය	40,000
විකුණුම්	480,000
ගැණුම්	280,000
වේතන	36,000
ණයගැතියෝ	75,000
ණයහිමියෝ	90,000
ගෙවූපොලී	18,000
ගෙන ඒමේ කුලී	16,000
මෝටර් රථ ක්ෂය වෙන්කිරීම්	120,000
ප්‍රාග්ධනය	300,000
බැංකු ගාස්තු	4000
10% බැංකු ණය	200,000
පරිත්‍යාග	12000
ගැනිලි	10000

අමතර තොරතුරු

1. 2018.12.31 දිනට තොගය 76000/= කි.
2. මෝටර් රථය වාර්ෂිකව 10% ක්ෂය කල යුතුය.

35) ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය වන්නේ,

i) රු: 220,000 ii) රු: 260,000 iii) රු: 320,000 iv) රු: 336,000

36) ව්‍යාපාරයේ ලාභා ලාභ ප්‍රකාශයේ මූල්‍ය හා වෙනත් වියදම් වල එකතුව වන්නේ,

i) රු: 22000 ii) රු: 24000 iii) රු: 34000 iv) රු: 36000

37) 2018.12.31 දිනට ව්‍යාපාරයේ හිමිකම වන්නේ,

i) රු: 378000 ii) රු: 386000 iii) රු: 388000 iv) රු: 450000

38) 2018.12.31 දිනට මෝටර් රථයේ ධාරණ අගය වන්නේ,

i) රු: 600,000 ii) රු: 480,000 iii) රු: 420,000 iv) රු: 360,000

39) 2018.12.31 දිනට ජංගම වගකීම් වල එකතුව

i) රු: 90000/= ii) රු: 92000/= iii) රු: 290,000/= iv) රු: 292,000/=

40) මෙම ව්‍යාපාරයේ බෙදා හැරීමේ වියදමක් හා පරිපාලන වියදමක් පිළිවෙලින් දැක්වෙන්නේ,

i) ගෙවූපොලි , වේතන
ii) ප්‍රචාරණය , බැංකු ගාස්තු
iii) මෝටර් රථ ක්ෂය , ගෙන ඒමේ කුලී
iv) මෝටර් රථ ක්ෂය , වේතන

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය	අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019	60 S II

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සැලකිය යුතුයි :- ● පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක්ද II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01 **පහත සිද්ධිය ඇසුරින් අංක (i) - (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

චිත්‍රකලාව පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සිටින නෙත්සරණි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පැවැත්වූ කෙටිකාලින බතික් වැඩමුළුවකටද සහභාගී වී අත්දැකීම් ලැබූ තරුණියකි. ඇය " එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා " ව්‍යාපෘතියට අනුව ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් රු: 800,000/= ක ණය මුදලක් සහන පොලී පදනමට ලබාගෙන " සරණි බතික්" නමින් ව්‍යාපාරයක් 2019.03.01 ආරම්භ කළාය. ඇය සාරි, සරොම්, කමිස හා විසිතුරු බිත්ති සැරසිලි නිර්මාණය කරයි. සේවිකාවන් පස්දෙනෙකු මෙහි සේවයට බඳවා ගෙන ඇති අතර විවිධ ප්‍රදේශවලට තම නිෂ්පාදිත බෙදා හැරීමට කුඩා ලොරි රථයක් ලබා ගැනීමටද ඇය අදහස් කරයි. සංචාරකයින් සඳහා විශේෂයෙන් නිෂ්පාදනය කරන ඇඳුම් හා බිත්ති සැරසිලි අලෙවි කිරීමට නියෝජිතයින් දෙදෙනෙක් බඳවා ගන්නා ලදි. ඇයගේ ව්‍යාපාරයේ මාර්තු මාසයේ සිදුවූ ගණුදෙනු පහත පරිදිය.

රෙදි හා අනෙකුත් ද්‍රව්‍ය ගැනුම්	240,000 - (140,000/= ද්‍රව්‍ය පමණක් භාවිත කොට ඇත)
උපකරණ මිලට ගැනුම්	200,000
ගොඩනැගිලි කුලී (මාස 03)	60,000
වැටුප්	125,000
විදුලිය (3.31 ට ගෙවා නැත)	15,000
ප්‍රවාහන කුලී	75,000
අත්පිට විකුණුම්	230,000
ණයට විකුණුම්	15,5000

1) අ). "සරණි බතික්" ව්‍යාපාරය සපුරා ලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද?
   ආ). "එම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් ලබා ගත හැකි වාසි 02 ක් සඳහන් කරන්න.
2) අ). මෙහි සඳහන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය?
   ආ). "සරණි බතික්" ව්‍යාපාරයේ නිෂ්පාදන සාධක නම් කර සිද්ධිය ඇසුරින් නිදසුන් සපයන්න.
3) අ). කලමනාකරණයේ සැලසුම්කරණයට අදාළ සිද්ධියක් ඡේදය ඇසුරින් ඉදිරිපත් කරන්න.
   ආ). මෙහි සඳහන් උපකාරක සේවා දෙකක් නම් කරන්න.
4) අ). ඇගේ ව්‍යාපාරයේ ශක්තියක් හා ඇතිවිය හැකියයි සිතිය හැකි තර්ජනයක් නම්කරන්න.
   ආ). අලෙවි මිශ්‍රයට අදාළ කාර්යයක් සිද්ධිය ඇසුරින් නිදසුන් සහිතව දක්වන්න.
5) මාර්තු 31 දිනට මුදල් ගිණුම පිළියෙල කොට අත ඉතිරි මුදල් ශේෂය සොයන්න.
6) අ). මෙම ව්‍යාපාරය පිළියෙල කළයුතු මූලික පොත් දෙකක් නම් කරන්න.
   ආ). බැංකුණය ලබා ගැනීමට අදාළ ද්විත්ව සටහන ඉදිරිපත් කරන්න.
7) අ). මෙම ව්‍යාපාරය උපකරණ වාර්ෂිකව 12% ක්ෂය කරයි නම් ව්‍යාපාරයේ ක්ෂය වියදම කොපමණද?
   ආ). ක්ෂය ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන වටිනාකම සහිතව දක්වන්න.
8) ව්‍යාපාරයේ මාර්තු මස ලාභය හෝ අලාභය ගණනය කරන්න.
9) අ). ව්‍යාපාරයේ ජංගම වත්කමක් හා ජංගම වගකීමක් වටිනාකම සහිතව සඳහන් කරන්න.
   ආ).නෙත්සරණි බැංකු ජංගම ගිණුමක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඇය බැංකුවේ රු. 25000/- තැන්පත් කරන්නේ නම් ඊට අදාළ ද්විත්ව සටහන ලියන්න.
10) අ). ව්‍යාපාරයේ 19.03.01 දිනට ගිණුම් සමීකරණය ලියන්න.
   ආ). 19.03.31 දිනට හිමිකම ගණනය කරන්න.

(ලකුණු 2x10 = 20)

I කොටස (ව්‍යාපාර අධ්‍යයනය)

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(02) i) අ). ව්‍යාපාරයක පොදු අරමුණු දෙකක් නම් කරන්න.
ආ). භාණ්ඩ හා සේවා වල වෙනස්කම් දෙකක් ලියන්න.

ii) පහත ප්‍රකාශ "සත්‍යද" "අසත්‍යද" යන්න දක්වන්න.
අ). මිනිස් වුවමනා සීමිත වන අතර අවශ්‍යතා අසීමිත වේ ( )
ආ). එළවළු වගාකරන ගොවියෙකු ඔහු විසින්ම පාරිභෝගිකයා ට එළවළු ලබාදීම ඍජු නිෂ්පාදනයයි ( )
ඉ). ව්‍යාපාර කටයුතු මෙහෙය වන්නේත් ව්‍යාපාරය පිළිබඳ ගත් තීරණ ක්‍රියාත්මක කරන්නේත් අයිතිකරුවන්ය ( )
ඊ). සමාගමක් විසින් සමාගම් පනතට අනුව කටයුතු කිරීම නෛතික පරිසරයට අයත්වේ ( )

iii) විශ්ව විද්‍යාල භූමියක් ආසන්න නිවසක ජීවත්වන චතුරිකා තම මවගේ සහාය ඇතිව ප්‍රදේශයේ ගොවීන්ගෙන් ලබා ගන්නා බතල, මඤ්ඤොක්කා, බඩඉරිඟු තම්බා සිසුන්ට හා මාර්ගයේ ගමන් කරන්නන් හට අලෙවි කරයි.
අ). චතුරිකාගේ ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් මෙම සිද්ධියේ සඳහන් පාර්ශව දෙකක් ලියන්න.
ආ). මෙම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයක් නම්කර එම පාර්ශවය ව්‍යාපාරය කෙරෙහි උනන්දුවීමට හේතුවක් ලියන්න.

iv කාර්මික විද්‍යාලයක මෝටර්රථ අළුත්වැඩියා පාඨමාලාවක් හැදෑරූ නිපුන් තම ව්‍යාපාරය පෞද්ගලික සමාගමක් ලෙස ඇරඹීමට කැමැත්තෙන් සිටී තනි පුද්ගල ව්‍යාපාරයකට වඩා පෞද්ගලික සමාගමක් ඇරඹීමේ වාසි 2 ක් දක්වන්න. (ලකුණු 2x4 - 8)

03) i) ගයත්‍රී තමාගේ පරිභෝජනයට අවශ්‍ය එළවළු ලතාගේ එළවළු වෙළඳසැලෙන් ලබාගත් අතර ජයනී තම ගෙවත්තේ නිෂ්පාදිත එළවළු ලතාට ලබාදෙයි.
අ) ඉහත සිද්ධියේ පාරිභෝගිකයා හා සිල්ලර වෙළෙන්දා නම්කර දක්වන්න.
ආ) ජයනිට තම එළවළු අලෙවි කිරිම සඳහා යොදා ගත හැකි විකල්ප මාර්ග ගැලීම් සටහනක් මගින් ඉදිරිපත් කරන්න.

ii) පහත ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
අ) සාපේක්ෂව ඒකකයක විකුණුම් මිල අඩුවීම සිල්ලර වෙළදාමේ ලක්ෂණයකි ( )
ආ) ජංගම රථ මගින් භාණ්ඩ අලෙවිකරන්නන් සංචාරක සුළු පරිමාණ වෙළෙන්දන් ලෙස හඳුන්වයි ( )
ඉ) ස්ථාවර තැන්පතු හා සම්බන්ධ කොන්දේසි බැංකුවේ අභිමතය පරිදි වෙනස් කලහැකිය ( )
ඊ) සමාන්තර රේඛා දෙකක් රහිතව බැංකුවක නම පමණක් ලියා තැබීම විශේෂ රේඛනය ලෙස සැලකිය හැකිය ( )

iii) අ) වර්තමාන ව්‍යාපාරිකයන් චෙක්පත් මගින් ගණුදෙනු කිරීමට පෙළඹී ඇති බව පෙනීයන කරුණකි. නමුත් බෝහෝ විට මෙම චෙක්පත් බැංකුව විසින් ප්‍රතික්ෂේප කරනු (අගරුවීම) දැකිය හැකිය. චෙක්පතක් එලෙස ප්‍රතික්ෂේප විමට බලපාන හේතු 2 ක් ලියන්න.
ආ) ජීවිත රක්ෂණයට බලපාන රක්ෂණ මූලධර්ම දෙකක් නම්කරන්න.

iv) අ) සෙව්මිණි මහනුවර ප්‍රධාන පෙළේ පාසලට දිනපතා පැමිණෙන්නේ දුම්රියෙනි. දුම්රිය පරිවහනයේ වාසියක් හා අවාසියක් ලියන්න.
ආ) දුම්රිය පරිවහනයට අදාළ අප රටේ ඇති රාජ්‍ය ආයතනය නම්කරන්න.

(04) i) විජේකෝන් මහතා හා සමරකෝන් මහතා සමකාලීනයන් වූ අතර දෙදෙනාට විශ්‍රාම යාමේදී ලද විශ්‍රාම පාරිතෝෂික මුදල ආයෝජන මාර්ග දෙකක ආයෝජනය කරන ලදි. වර්ෂ අවසානයේදී විජේකෝන් මහතාට ලාභාංශ ආදායමක් ලැබුන බවත් සමරකෝන් මහතාට පොලී ආදායමක් ලැබූ බවත් පවසන ලදි.
අ) විජේකෝන් මහතා කල ආයෝජන මාර්ගය කුමක් විය හැකිද?
ආ) සමරකෝන් මහතා කල ආයෝජන මාර්ගය කුමක් විය හැකිද?

ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
අ) පැහැදිලිබව සන්නිවේදන ක්‍රියාවලියට ඇතුලත් මූලිකාංගයකි ( )
ආ) ව්‍යාපාර අරමුණු ආරක්ෂිත අයුරින් ඉටුකර ගැනීම කාර්යක්ෂමතාවයයි ( )
ඉ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ෂණීය ලෙස මෙන්ම ලාභදායීව තෘප්තිමත් කලහැකි පාරිභෝගික කොටස ඉලක්ක වෙළඳපොලයි ( )
ඊ) අලෙවිකරණ සංකල්පය පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම සමඟ බැඳුන ක්‍රියාවලියකි ( )

iii). ගුණාත්මක හා පෝෂදායී ආහාර වර්ග නිෂ්පාදන ආයතනයක ක්‍රියාවලීන් කීපයක් පහත දැක්වේ.
අ). ආහාර නිෂ්පාදනය සම්බන්ධව කළමනාකරුවන් පත්කිරීම හා අවශ්‍ය සම්පත් ලබාදීම.
ආ). නිෂ්පාදනය කලයුතු ආහාර වර්ග පිළිබඳ තීරණය කිරීම.
ඉ). නිෂ්පාදිත ආහාර වල අඩුපාඩු මගහරවා ගැනීමට අවශ්‍ය ද එක් කිරීම.
ඊ). නිෂ්පාදන කළමනාකරුවන් තම සේවකයින්ට උපදෙස් ලබාදීම.
කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යයන් අනුපිළිවෙලින් දක්වන්න.
(iv). අ). ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක 02ක් නම් කරන්න.
ආ). ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ කුමක්ද

II කොටස

05 i). අ). ව්‍යාපාරයක අයිතිකරුගේ හිමිකම වෙනස් විමට බලපාන කරුණු දෙකක් දක්වන්න.
ආ). වගකීමක ලක්ෂණ දෙකක් නම්කරන්න. (ල.02)
ii). නිමි ඇඳුම් අලෙවි කිරීමේ නිරත ව්‍යාපාරයක පහත දක්වා ඇති අයිතම වත්කම්, වගකීම්, ආදායම්, වියදම්, හිමිකම් යන ශිර්ෂ යටතේ වර්ග කරන්න.
අ). විදුලිය -
ආ). මෝටර්රථ -
ඉ). ප්‍රාග්ධනය -
ඊ). ණයගැතියෝ -
උ). බැංකු අයිරාව -
ඌ). ලැබූ කොමිස් (ල.02)
iii). සමදරා ව්‍යාපාරයේ 2019 ජනවාරි මාසය තුල සිදුවී ඇති ගණුදෙනු වලින් ගිණුම්කරණ සමීකරණයට වූ බලපෑම පහත දක්වා ඇත.

	වත්කම් රු:					හිමිකම්	+ වගකීම්
	මෝටර්රථ	+ බඩුතොග	+ ණයගැති	+ මුදල්	=	ප්‍රාග්ධනය	+ ණයහිමි
ශේෂය	800,000	150000	220000	130,000	=	1020000	280,000
01.05		-60000	+100000		=	+40000	
01.12				-40000	=	-40000	
01.16	-20000				=	-20000	
01.23				-25000	=	+ 5000	-30000

* මෙම ව්‍යාපාරයේ අයිතිකරු මාසය තුල ගැනිලි සිදුකර නැත.
(ල.04)
iv) නඳුන්ගේ ව්‍යාපාරය 2019 මාර්තු මාසය තුල සිදුකල ණයට විකුනුම් පහත දැක්වේ.

2019.03.11 - ලසන්තට වික්කා රු: 60000 (ඉ.අං. 22)
2019.03.21 - හසින්තට වික්කා රු. 44000 (ඉ.අං 23)
2019.03.26 - නිමන්තට වික්කා රු: 72000 (ඉ.අං.24)
2019.03.30 - ගයන්තට කාර්යාල මේසය ණයට වික්කා රු. 12000/=

*ව්‍යාපාරය සෑම විකුනුමක් සඳහා 5% වෙළඳ වට්ටම් ලබාදීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තියයි. අවශ්‍යවන්නේ,

අ). 2019 මාර්තු මාසය සඳහා නඳුන්ගේ ව්‍යාපාරයේ විකුනුම් ජ'නලය
ආ). 2019.03.31 දිනට එම තොරතුරු ලෙජරයට පිටපත් කිරීම (ල.04)
(6) i) අ). බැංකු අයිරාව යන්න නිර්වචනය කරන්න.
ආ). බැංකු ගිණුමේ ශේෂයට වඩා බැංකු ප්‍රකාශයේ ශේෂය වැඩිවන අවස්ථා 02ක් දක්වන්න. (ල.02)
ii) බ්ලොක්ගල් නිෂ්පාදන ව්‍යාපාරයක 2019 ජූනි මාසයට අදාළ පිරිවැය තොරතුරු පහත දැක්වේ.

අමුද්‍රව්‍ය ගැනුම්	180,000
කම්හල් විදුලිය	6000
යන්ත්‍ර ක්ෂය	5000
නිෂ්පාදන වැටුප්	44000

ගොඩනැගිලි කුලී 25000

මෙම ව්‍යාපාරයට 20% ලාභාන්තිකයක් තබා ගැනීමට තීරණය කර ඇත.

අ). මෙම ව්‍යාපාරයේ ප්‍රාථමික පිරිවැය

ආ). ව්‍යාපාරයේ මුළු විකුනුම් ආදායම (ල.02)

iii) 2019 අගෝස්තු මාසයේ චේතියගේ ව්‍යාපාරය පිළියෙල කල බැංකු ගිණුම පහත දැක්වේ.

බැංකු ගිණුම

දිනය	විස්තරය	ස. පි.	මුදල	දිනය	විස්තරය	ස. පි.	මුදල
19.8.1	ඉ/ගෙ ශේෂය		54000	19.8.8	සුගන්ධි (72)		28000
8.6	මුදල්		12000	19.8.14	වරුණි (73)		14000
8.9	චෙක් (113)		17000	19.8.21	හංසි (74)		9000
8.17	චෙක් (176)		31000	8.31	ශේෂය ප/ගෙ		63000
			114000				114000

2019 අගෝස්තු මාසය සඳහා බැංකු ප්‍රකාශය

දිනය	විස්තරය	හර	බැර	ශේෂය
2019.8.1	ඉ/ගෙ ශේෂය			54000
8.6	මුදල්		12000	66000
8.10	චෙක් (72)	28000		38000
8.12	චෙක් (113)		17000	55000
8.15	ණයගැති ප්‍රේෂණ		24000	79000
8.19	චෙක් (73)	9000		70000
8.29	බැංකු ගාස්තු	2000		68000

අවශ්‍ය වන්නේ,

අ). සංශෝධිත බැංකු ගිණුම

ආ). බැංකු සැසඳුම් ප්‍රකාශය (ල.04)

iv). 2018.12.31 දිනට සංදීපනීගේ ව්‍යාපාරය පිළියෙල කල ශේෂ පිරික්සුමේ හර එකතුව රු. 1000/= වැඩියෙන් සටහන්ව තිබුණි. පසුව පහත වැරදි සොයාගන්නා ලදි.

1. ණයට ගැණුම් 21500/= ණයහිමි ගිණුමේ 12500/- ලෙස සටහන් කර තිබීම.
2. ලැබූ වට්ටම් රු. 4000/= දුන් වට්ටම් ගිණුමේ සටහන්ව තිබීම.
3. විකුනුම් ජ'නලයේ එකතුව රු. 16000/= වැඩියෙන් සටහන්ව තිබීම.

අවශ්‍ය වන්නේ,

අ). ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්

ආ). අවිනිශ්චිත ගිණුම

07) i) අ). මූල්‍ය තත්ව ප්‍රකාශයක ඇතුලත් කරන මූලිකාංග නම් කරන්න.

ආ). ලාභාලාභ ප්‍රකාශය පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගන්නා සංකල්ප දෙකක් නම්කරන්න. (ල.02)

ii) "ජයසිකුරුයි" ක්‍රීඩා සමාජයේ ආධුනික භාණ්ඩාගාරිකතුමා 2019 මැයි මාසයට අදාළව පිළියෙල කළ ලැබීම් ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

2019.5.1 ඉ/ගේ ශේෂය	37000	ක්‍රීඩා උපකරණ ගැණුම්	20000
සාමාජික මුදල්	58000	විදුලිය ගාස්තු	4000
ලැබිය යුතු සාමාජික මුදල්	12000	ගෙවිය යුතු ගොඩනැගිලි කුලී	12000
		කොඩි විකුණුම් ආදායම්	15000
		ක්‍රීඩා උපකරණ ක්ෂය	4000
		ශේෂය ප/ගෙ/ගි	52000
	107000		107000

මෙම ලැබීම් ගෙවීම් ගිණුම් නිවැරදි කොට පිළියෙල කරන්න.

iii) කසුනිගේ වෙළඳ ව්‍යාපාරයේ 2018.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර (රු:)	බැර (රු:)
ප්‍රාග්ධනය		200,000
ආරම්භක තොගය (2018.01.01)	36000	
ගැණුම්	180,000	
විකුණුම්		450,000
ණයගැතියෙන්	158,000	
බැංකුණය 12%		300,000
වේතන	45000	
විකුණුම් කොමිස්	18000	
මුදල්	252000	
ණයපොලී	30000	
විදුලිය	24000	
යන්ත්‍ර	400,000	
යන්ත්‍ර ක්ෂය වෙන්කිරීම		160,000
ණයහිමියෝ		18000
ලැබූ කුලී		5000
	1143000	1143000

අමතර තොරතුරු

1. 2018.12.31 දිනට තොගයේ පිරිවැය 36000.
2. ණයගැතියන්ගෙන් රු: 3000/= බොල් ණය කපා හළ යුතුය.
3. යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට 10% ක්ෂය කලයුතුය.
4. උපචිත කුලී අදායම රු: 5000/=

අවශ්‍යවන්නේ

1. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයට ලාභාලාභ ප්‍රකාශය
2. 2018.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

(ල.08)

තෙවන වාර පරීක්ෂණය - 2019

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

11 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය

I පත්‍රය

1) 2	11) 4	21) 2	31) 3
2) 2	12) 2	22) 4	32) 3
3) 1	13) 2	23) 4	33) 3
4) 3	14) 1	24) 4	34) 1
5) 1	15) 1	25) 1	35) 2
6) 4	16) 3	26) 3	36) 4
7) 4	17) 4	27) 2	37) 2
8) 3	18) 2	28) 3	38) 3
9) 1	19) 3	29) 3	39) 2
10) 3	20) 3	30) 1	40) 4

II පිළිතුරු පත්‍රය

01 i) අ) ඇඳුම් (ල 01)

ආ) * අනන්‍යතාවයක් ලැබීම
* පිළිගැනීමක් ඇතිවීම
* ණය ලබාගැනීම පහසුවීම

} (කරුණු 2 ල 01)

ii) අ) සංස්ථා (ල 01)

ආ) ශ්‍රමය - සේවකයින්
ප්‍රාග්ධනය - උපකරණ , මුදල් , රෙදි
ව්‍යවසාය - නෙත්සරණි / අයිතිකරු

} (කරුණු 2 ල 01)

iii) අ) ලොරි රථයක් ලබාගැනීමට අදහස් කිරීම (ල 01)

ආ) ප්‍රවාහනය , බැංකු (ල 01)

iv) අ) ශක්තිය - * ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම
* බතික් වැඩමුළුවකට සහභාගි වී අත්දැකීම් ලැබීම

} (ල 1/2)

තර්ජන * තරඟකාරී ව්‍යාපාරයක් බිහිවීම
* සංචාරකයන්ගේ නොපැමිණීම

} (ල 1/2)

ආ) ස්ථානය - කුඩා ලොරි රථයකින් බෙදා හැරීම (ල.01)

v)

මුදල් ගිණුම				
ණය	800,000	ගැනුම්	240,000	
විකුණුම්	230,000	උපකරණ	200,000	
		ගොඩ - කුලී	60,000	
		වැටුප්	125,000	
		ප්‍රවාහන කුලී	75,000	
		ශේෂය ප/ගෙ	330,000	(ල.02)
	1,030,000		1,030,000	
ඉ/ගෙ ශේෂය	330,000			

මුදල් ශේෂය - (ල 02) පිළිතුරු නැත්නම්, ඕනෑම අයිතම 5ක මුදල් පොතේ දක්වා තිබීමට (ල 01)

vi) අ) මුදල්පොත රු. 330,000/=

විකුණුම් ජ'නලය (ල 01)

ආ) මුදල් ගිණුම (හර)
බැංකු ණය ගිණුම (බැර)

vii) අ) $200,000 \times \frac{12}{100} \times \frac{1}{12} =$ රු. 2000 (ල 01)

ආ) උපකරණ ක්ෂය ගිණුම (හර) 2000
උපකරණ ක්ෂය වෙන් ගිණුම (බැර) 2000 (ල 01)

ආදායම් ප්‍රකාශය		
විකුණුම්		385,000
විකුණුම් පිරිවැය		140,000
දළ ලාභය		245,000
වියදම්		
ගොඩ කුලී	20000	
වැටුප්	125,000	
විදුලිය	15000	
ප්‍රවාහනය	75000	
උප. ක්ෂය	2000	237,000
ශුද්ධ ලාභය		8000

(ල 02)

(පිළිතුර නැත්නම් * අයිතම 5ක් දැක්වීමට) (ල 01)

ix) අ) ජංගම වත්කම් - මුදල් - 330,000
ණයගැතියෝ - 155,000
තොගය - 100,000 } (එක් කරුණකට ල. 1/2)
ජංගම වගකීම් - උපචිත විදුලිය 15000 (ල. 1/2)

ආ) බැංකු ගිණුම (හර) 25000
මුදල් ගිණුම (බැර) 25000 (ල 01)

x) අ) වත්කම් = වගකීම්
රු. 800,000 = රු. 800,000 (බැංකු ණය) (ල 01)

ආ) ප්‍රාග්ධනය = -
+ ශු. ලාභය = 8000
19.3.31 හිමිකම = 8000 (ල 01)

(මුළු ලකුණු 20)

I කොටස

2 i) අ) ලාභ ඉපයීම
පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම (කරුනු 2ට ල 01)

ආ) භාණ්ඩ | සේවා
* භෞතිකයි | * භෞතික නොවේ
* ගබඩා කලහැක | * ගබඩා කල නොහැක
* සපයන්නාගෙන් වෙන්කල හැක | * සපයන්නාගෙන් වෙන්කල නොහැක

(කරුනු 2ට ල 01)

ii) අ) අසත්‍යයි ආ) අසත්‍යයි ඉ) අසත්‍යයි ඊ) සත්‍යයි

iii) අ) චතුරිකා (අයිතිකරු)
මව (සහායිකාව) } (ල. 1)
ආ) උනන්දුවක් දක්වන ඕනෑම පාර්ශවයක් හා අරමුණකට (ල 01)

ix) නෛතික පුද්ගලභාවයක් තිබීම
සීසාසහිත වගකීම
අඛන්ඩ පැවැත්මක් තිබීම } (කරුණු 2කට ල.0 2)

3 i) අ) පාරිභෝගිකයා - ගයත්‍රී
සිල්ලර වෙළෙන්දා - ලතා (ල 01)

ආ) ජයනි

ගයත්‍රී (පාරිභෝගිකයා) | ලතා (සිල්ලර වෙළෙන්දා) | නියෝජිතයා
| පාරිභෝගිකයා | සිල්ලර වෙළෙන්දා
| | පාරිභෝගිකයා

බෙදාහැරීමේ මාර්ග දක්වා තිබිය යුතුයි (ල 01)

ii) අ) අසත්‍යයි ආ) සත්‍යයි ඉ) අසත්‍යයි ඊ) සත්‍යයි

(ල 1/2x4 - 02)

iii) අ) * ආදර්ශ අත්සන වැරදීම * ගිණුමේ මුදල් නොමැති වීම
* කාලය ඉකුත් වී තිබීම * වැරදියට ලියා තිබීම

ආ) * උපරිම විශ්වාශය * හානි පූර්ණය * රක්‍ෂ හිමිකම (ල 01)

iv) අ) වාසි - පිරිවැය අඩුවීම
එකවර විශාල මගීන් හා භාණ්ඩ ප්‍රමාණයක් රැගෙනයා හැකිවීම
මාර්ග තදබදයක් නොමැතිවීම
අවාසි - ගමනාන්තය දක්වා යොදා ගත නොහැකිවීම
කාලසටහනකට ගමන් කිරීම නිසා අවශ්‍ය පරිදි යොදා ගත නොහැකිවීම
(වාසි/අවාසියක් සඳහා ල 01)

ආ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (ල 01)

4 i) අ) කොටස් මිලදී ගැනීමේ ආයෝජන (ල 01)
ආ) ස්ථාවර තැන්පතු / ඉතිරි කිරීමේ තැන්පතුවක ආයෝජනය (ල 01)

ii) අ) අසත්‍යයි ආ) අසත්‍යයි ඉ) සත්‍යයි ඊ) සත්‍යයි

iii) අ) සංවිධානකරණය
ආ) සැලසුම්කරණය
ඉ) පාලනය
ඊ) මෙහෙයවීම (ල 1/2 x 4 ල 02)

iv) අ) ආයෝජනයේ අරමුණු
අවදානම
ලැබෙන ප්‍රතිලාභ (කරුනු 2 ල 01)

ආ) කොටස් වෙළඳපල කටයුතු විධිමත්ව හා සාධාරණව පවත්වාගෙන යාම (ල 01)

II කොටස

5 i) අ) අමතර ප්‍රාග්ධනය යෙදවීම
ගැනිලි
ආදායම්
වියදම් (කරුනු 2x1/2 ල 01)

ආ) අතීත ගණුදෙනුවක ප්‍රතිපලයක් වීම
වර්තමාන බැඳීමක් පැවතීම
වගකීම් පියවීමේදී ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාම (කරුනු 2x1/2 ල 01)

ii) අ) වියදම් ආ වත්කම් ඉ) හිමිකම්
ඊ) වත්කම් උ) වගකීම් ඌ) ආදායම්
(කරුනු 3ට ල 01-02)

iii) 01.05 - රු. 60000/= තොගයක් රු. 100,000/= ණයට විකිණීම ලාභය රු. 40000/=
01.12 - රු. 40000/= වියදමක් සිදුකිරීම
01.16 - මෝටර්රථ ක්ෂය රු. 20000/=
01.23 - රු. 30000/= ණයහිමියන්ට රු. 25000/= ගෙවීම ලද වට්ටම රු. 5000/=
(ගණුදෙනු 1x ල 01-ලකුණු 04)

iv) විකුණුම් ජ'නලය

දිනය	ඉන්.අං	ගැණුම්කරු	වටිනාකම	ලෙ. පි
03.11	22	ලසන්ත	57000	(1/2)
03.21	23	හසින්ත	41800	(1/2)
03.26	24	නිමන්ත	68400	(1/2)
03.31		විකුණුම් ගිණුමට (1/2) බැරකලා	167200	

(දිනය හා නිවැරදි ගිණුම් ආකෘතිය තිබිය යුතුය.)

ලසන්ත ගිණුම

දිනය	විස්තරය	ස පි.	වටිනාකම	දිනය	විස්තරය	ස පි.	වටිනාකම
03.11	විකුණුම්		57000(1/2)				

හසින්ත ගිණුම

දිනය	විස්තරය	ස පි.	වටිනාකම	දිනය	විස්තරය	ස පි.	වටිනාකම
03.21	විකුණුම්		41800 (1/2)				

නිමන්ත ගිණුම

දිනය	විස්තරය	ස පි.	වටිනාකම	දිනය	විස්තරය	ස පි.	වටිනාකම
03.26	විකුණුම්		68400 (1/2)				

විකුණුම් ගිණුම

දිනය	විස්තරය	ස පි.	වටිනාකම	දිනය	විස්තරය	ස පි.	වටිනාකම
				03.31	ණයගැති		167200 (1/2)

6 I) අ) ජංගම ගිණුම් හිමියෙකුට තම ගිණුමේ ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත්කිරීමට බැංකුව ලබාදෙන අවසරය බැංකු අයිරාවයි.

ආ) නිකුත් කළ චෙක් පත් සඳහා බැංකුව මුදල් නොගෙවීම
සෘජු ප්‍රේෂණ රැස් කර ගෙන තිබීම
නිකුත්කල අගරු වූ චෙක් ව්‍යාපාරයේ සටහන් නොවීම

(කරුණු 2 ල 01)

ii) අ) ප්‍රාථමික පිරිවැය - අමුද්‍රව්‍ය ගැනුම් 180,000
නිෂ්පාදන වැටුප් 44,000
224,000

(ල 01)

ආ)

ප්‍රාථමික පිරිවැය	224,000
කම්හල් විදුලිය	6000
යන්ත්‍ර ක්ෂය	5000
ගොඩනැගිලි කුලි	25000
මුළු පිරිවැය	260,000 x $\frac{20}{100}$
ලාභය	52,000
මුළු විකුණුම් ආදායම්	312,000 (ල 01)

iii) සංශෝධිත බැංකු ගිණුම

ඉ/ගෙ ශේෂය	63,000	බැංකු ගාස්තු	2000
ණයගැති ප්‍රේෂණ	24,000	ශේෂය ප/ගෙ	85,000
	87,000		87,000
ශේෂය ඉ/ගෙ	85,000		

8.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය

සංශෝධිත බැංකු ශේෂය (ල.1/2)	85,000
+ නිකුත්කල ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්	14,000 (ල.1/2)
	99,000
- තැන්පත්කල නිශ්කාශනය නොවූ චෙක්	31,000 (ල.1/2)
8.31ට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය (ල.1/2)	68,000

iv

පොදු ජ'නලය

දිනය	වවු.අං	විස්තරය	ලෙ.පි	හර	බැර
1)		අවිනිශ්චිත ගිණුම		9000	
		ණයහිමි ගිණුම			9000
		(ණයහිමි ගිණුම 9000/= අඩුවෙන් සටහන්ව තිබීම)			
2)		අවිනිශ්චිත ගිණුම		8000	
		දුන්වට්ටම			4000
		ලැබූවට්ටම්			4000
		(ලැබූවට්ටම් 4000/= දුන්වට්ටම් ගිණුමට හරකර තිබීම)			
3)		විකුණුම් ගිණුම		16,000	
		අවිනිශ්චිත ගිණුම			16,000
		(විකුණුම් 16,000/= වැඩියෙන් සටහන්ව තිබීම)			

(නිවැරදි ජ"නල් සටහනකට ලකුණු 01 බැගින්
සංලක්‍ෂ නොමැතිනම් ලකුණු 1 1/2ක් අඩුකරන්න)

අවිනිශ්චිත ගිණුම

ණයහිමි ගිණුම	9000	ඉ/ගෙ ශේෂය	1000
දුන්වට්ටම්	4000	විකුණුම් ශේෂය	16,000
ලැබූවට්ටම්	4000		
	17,000		17,000

(අයිතම 4ක් නිවැරදි නම් ලකුණු 01)

7 I) අ) වත්කම්
වගකීම්
හිමිකම් (ලකුණු 01)

ආ) ගැලපුම් සංකල්පය
අපචිත සංකල්පය
කාලච්ඡේද සංකල්පය (ලකුණු 01)

ii) ලැබීම් හා ගෙවීම් ගිණුම

2019/5/1 ඉ/ගෙ ශේෂය	37,000	ක්‍රීඩා උපකරණ ගැනුම්	20,000
සාමාජික මුදල්	58,000 } 01	විදුලිය ගාස්තු	4000 } 01
කොඩි විකුණුම් ආදායම්	15,000	ශේෂය ප/ගෙ	86,000
	110,000		110,000

සඳමලීගේ ව්‍යාපාරය (1/2)
2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභලාභ ප්‍රකාශය

iii)

විකුණුම්			450,000
විකුණුම් පිරිවැය			
2018.01.01 තොගය		36,000	
ගැනුම්		180,000	
		216,000	
අවසාන තොගය		(1/2) 36,000	180,000 (1/2)
දල ලාභය			270,000
වෙනත් ආදායම්			
කුලී ආදායම්			20,000 (1/2)
			290,000
පරිපාලන වියදම්			
යන්ත්‍ර ක්ෂය	40,000 (1/2)		
වේතන	45,000		
විදුලිය	24,000	109,000	
බෙදාහැරීමේ වියදම්	(1/2)		
බොල් ණය	3000		
විකුණුම් කොමිස්	18,000	21,000	
මූල්‍ය හා වෙනත් වියදම්	(1/2)		
ණය පොලී	36,000	36,000	166,000
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට හර කලා	(1/2)		124,000

(ලකුණු 04)

සඳමලීගේ ව්‍යාපාරය
2018.12.31 දිනට (1/2)
මූල්‍ය තත්ව ප්‍රකාශය

ජංගම නොවන වත්කම්	පිරිවැය	සමු.ක්ෂය	ධාරණ අගය (1/2)
යන්ත්‍ර	400,000	200,000	200,000 (1/2)
	400,000	200,000	200,000
ජංගම වත්කම්			
තොගය		36,000	
ලැබිය යුතු කුලී ආදායම්		50,00	(1/2) බැගින් 1 1/2)
ණය ගැතියෝ		155,000	
මුදල්		252,000	448,000
			648,000
ප්‍රාග්ධනය		200,000	
+ ශුද්ධ ලාභය		(1/2) 124,000	324,000
ජංගම නොවන වගකීම්			
බැංකු ණය			300,000
ජංගම වගකීම්			
ණයහිමියෝ		18,000	
උපචිත ණයපොලී		6000 (1/2)	24,000
			648,000

(ලකුණු 04)